ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි-මාර්ග) - 2018

-----------------------------------------------------------------------

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනෙහි (අයි-මාර්ග) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අදියර I සඳහා 2014 නොවැම්බර් 05 දින එළැඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය, අදියර II සඳහා 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස් ආර් අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර III සඳහා 2015 දෙසැම්බර් 11 දින එළඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර IV සඳහා 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, වැඩසටහනේ කාලය

-----------------------------------------------------------------------

ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන **117,780** කට සමාන ඇ.ඩො.මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් බහු අදියර ණය පහසුකම් යටතේ අදියර 06 කින් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් මූල්‍යනය කිරීමට නියමිතය. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 මාර්තු 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතී වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

වැඩසටහන මගින් වාර්ෂිකව හා වරින් වර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එහි සියලු ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ මුළු වියදම රු. මිලියන 10,823.16 ක් වූ අතර වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන රු. මිලියන 12,419.59 ක අනුරූපී මුදල සමඟ එකඟ නොවීය. | මූල්‍ය ප්‍රකාශනවල සැසඳුම් නොකරන ලද ශේෂයන් පැවතුනි. | මහා භාණ්ඩාගාරයේ ලෙජර ගිණුම් වසා දැමීමෙන් පසු ගිණුම්ගත නොකළ රු. මිලියන 1,596.43 ක මුදල විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් අනුරූපී ශේෂයන් මහා භාණ්ඩාගාරයේ වාර්තා සමග කලානුරූපිව සැසඳුම් කල යුතුය |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අ) | කොන්ත්‍රාත් කොන්දේසි 4.17 වගන්තිය. | එම කොන්දේසියට අනුව, වැඩ කටයුතු කරගෙන යාම සඳහා භාවිතා කළ යුතු යැයි සැලකෙන වැඩබිමට ගෙන එන ලද කොන්ත්‍රාත්කරුගේ සියලු උපකරණ සඳහා කොන්ත්‍රාත්කරු වගකිව යුතුවේ. එම උපකරණ වැඩබිමේ කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝගී කරගත යුතු අතර වැඩබිම් ඉංජිනේරුවරයාගේ අවසරයකින් තොරව එම ස්ථානයෙන් ඉවත් නොකෙරේ. කෙසේවෙතත්, 2018 ඔක්තෝබර් 16 දින ඉහත කොන්ත්‍රාත්තුව | අත්තිකාරම් අයකර ගැනීමේදී ඇති විය හැකි අවදානම් | නිසිලෙස ප්‍රතිචාර නොදැක්වීය. | ආරවුල් නොමැතිව කාරණය විසඳීමට සහ ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන් හඳුනා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අවසන් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිර්දේශය ලබාදීමෙන් පසුව පැකේජ 03 ක් යටතේ සබරගමුව පළාතේ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්කරු සතුව තිබූ යන්ත්‍රෝපකරණ, උපකරණ ආදිය මාර්ග සංවර්ධන අධිකාරියේ අනුදැනුමකින් තොරව ඉවත් කර ඇත. | | | |
| ආ) | කොන්ත්‍රාත් කොන්දේසි 4.17 වගන්තිය. | අත්තිකාරම් සුරක්ෂණයේ වටිනාකම වූ රු. මිලියන 30.26 ක මුදල ඉක්මවා කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවකුට රු. මිලියන 304.23 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය අනුග්‍රහයක් ලබා දීම සහ අත්තිකාරම් අය කර ගැනීම කළ නොහැකි වනු ඇත | අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගෙන තිබේ. | අත්තිකාරම් සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි සුරක්ෂණ ලබාගැනීමට පියවර ගත යුතුය. |
| ඇ) | කොන්ත්‍රාත් කොන්දේසි 4.17 වගන්තිය | කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව, එක් එක් කොන්ත්‍රාත් පැකේජ යටතේ වෙන වෙනම වැඩබිම් රසායනාගාර ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නිරතවී සිටින කොන්ත්‍රාත්කරු විසින් පරීක්ෂණ කටයුතු සඳහා එක් වැඩබිම් රසායනාගාරයක් ස්ථාපිත කර තිබුණි. | සීමිත නියැදි පරීක්ෂණ හේතුවෙන් තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණය දුර්වල වනු ඇත | කොන්ත්‍රාත්කරු විසින් එක් වැඩබිම් රසායනාගාරයක් සපයා ඇති අතර වර්තමාන ප්‍රගතියට අනුකූලව පරීක්ෂණ සිදු කිරීම ප්‍රමාණවත් වේ. අනෙක අවශ්‍ය වූ විට පසුව සපයා දෙනු ඇත. | වැඩ වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා විධිමත් පරීක්ෂණ සිදු කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කළ යුතු අතර තත්ත්ව පාලන යාන්ත්‍රණය ව්‍යාපෘතිය විසින් අධීක්ෂණය කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඇ) | කොන්ත්‍රාත් කොන්දේසි 14.6 උප වගන්තිය. | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අවම අතුරු ගෙවීම් ප්‍රමාණය කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 1.5 ක් ලෙස තීරණය විය. කෙසේවෙතත්, අතුරු ගෙවීම් සහතික ඇගයීමේදී පැකේජ 21 ක් යටතේ අවශ්‍ය සීමාවට වඩා අඩුවූ අවස්ථා 102 ක් විය. | අතුරු සහතික මත වූ ඇගයීම සඳහා අතුරු ගෙවීම් පිරිවැය ඉක්මවා යාම. | කොන්ත්‍රාත්තුවේ විධිවිධාන අනිවාර්ය නොවන බැවින් කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රගතිය මත පදනම්ව ගෙවීම් නිර්දේශ කිරීමට සේවායෝජක විසින් තීරණයක් ගන්නා ලදී. | කොන්ත්‍රාත්කරුවන් සඳහා පිරිවැය, කාලය සහ අනවශ්‍ය අනුග්‍රහය අවම කිරීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසියෙහි දක්වා ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය කෙරේ. |
| ඉ) | කොන්ත්‍රාත් කොන්දේසි 1.14 උප වගන්තිය | උප වගන්තියට අනුව කොන්ත්‍රාත් පුද්ගලයන් 2 ක් හෝ වැඩි ගණනක් සමඟ බද්ධ ව්‍යාපාර, ඒකාබද්ධ හවුල් හෝ වෙනත් සංස්ථාපිත නොවන කණ්ඩායම්ගත කිරීමක් කරන්නේ නම්, මෙම පුද්ගලයන් කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය සඳහා ඒකාබද්ධව හා සාමුහිකව සේවායෝජකයාට බැඳී සිටින බවට සලකනු ලැබේ. කෙසේවෙතත්, කළුතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 2 ක් යටතේ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්කරු විදේශ හවුල්කරුවෙකු සමඟ බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් භාරගැනීමට ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා විදේශීය හවුල්කරුගේ නියෝජිතයන් සහභාගී වූ බවට කිසිඳු සාක්ෂියක් ලැබී නොමැත. | බද්ධ ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ වගකීම නිර්වචනය කල නොහැක. | බද්ධ ව්‍යාපාර හවුල්කරුවන් කැඳවීමට සේවායෝජක පියවර ගෙන තිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා බද්ධ ව්‍යාපාරයේ සියළුම හවුල්කරුවන් කැඳවීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගත යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

----------------------------

**3.1** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | විගණකගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ | බලපෑම | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| ------- | ------------- | -------------------------------------------------- | ---------- | ---------------------- | -------------- |
| (අ) | ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීම | මූලික සැලසුම් වලට අනුව ජාතික මාර්ග කිලෝමීටර් 400 ක මාර්ග පුනරුත්ථාපන කටයුතු කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේවෙතත්, වැඩසටහන යටතේ වූ වැඩවල විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් ජාතික මාර්ගවල දිග කිලෝමීටර් 284.52 දක්වා අඩු කරන ලදී. වැඩසටහනේ කටයුතු ආරම්භ කළ දින සිට වසර 03 කට පසු කොන්ත්‍රාත්තු වලින් මරදන්කඩවල - හබරන පාරේ කිලෝමීටර් 25 පමණක් පුනරුත්ථාපනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර ඇත. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් පිරිවැය ඉහළ යා හැකිය. | 2019 ජුනි 05 වන දින මරදන්කඩවල - හබරාන පාරේ කොටස පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර අනෙකුත් මාර්ගවල මූලික සමීක්ෂණ හා සැලසුම් කටයුතු සිදු වෙමින් පවතී. | කාල ඉලක්කයන් ළඟා කර ගැනීමට,පිරිවැය ඉහළයාම වළක්වාගැනීමට, ව්‍යාපෘති කාලය දීර්ඝ වීම වැළක්වීමට කොන්ත්‍රාත්කරුවන් ට බලපෑම් කිරීම අවශ්‍යය කෙරේ. |
| (ආ) | පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම | ක්‍රියාකාරී සැලැස්මට අනුව දකුණු, මධ්‍යම, සබරගමුව, වයඹ සහ උතුරුමැද පළාත්වල සහ බටහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 3,033.58 ක් පුනරුත්ථාපනය කිරීමට නියමිතය. පළාත් වල මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ. | | පුනරුත්ථාපන කටයුතු වල ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දිනට මන්දගාමීව පැවතුනද, කඩිනම් පියවර ගෙන තිබුණි. | |

| <u>පළාත</u> | <u>ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ</u> | | | <u>හේතු</u> |
|---|---|---|---|---|
| | <u>අපේක්ෂිත</u> | | **<u>2017 දෙසැම්බර් 31 දිනට ලඟාකර ගැනීම්</u>** | |
| | නිම කිරීමට නියමිත දිනය | කි.ම | කි.මී | |
| දකුණු | 17 මැයි 2017 | 588.50 | 542.40 | කොන්ත්‍රාත්ක-රුවන්ගේ දුර්වල කාර්යසාධනය |
| මධ්‍යම | 15 දෙසැම්බර් 2017 | 582.21 | 542.40 | |
| වයඹ | 31 ජූලි 2018 | 610.97 | 434.43 | |
| සබරගමුව | 15 දෙසැම්බර් 2017 | 274.27 | 323.88 | |
| කළුතර | 24 ජූලි 2018 | 269.41 | 121.27 | |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අ) | කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් 183 ක පුනරුත්ථාපන කටයුතුවල නියැලී සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රගතිය කොන්ත්‍රාත්කරු මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉලක්කයන්ට පසුපසින් ඇති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් ප්‍රදානය කරන අවස්ථාවේ දී කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාව තක්සේරු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවට ලබා දුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 560.97 ක් 2018 දෙසැම්බර්31 වන විට අයකරගෙන නොතිබුණි. | බොහෝ දුරට මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීමට අසමත් වීම | අනාගතයේ දී ලංසුකරුවන්ගේ මූල්‍ය හැකියාව තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වල ශේෂය අය ගැනීමට උපරිම උත්සාහයන් ගෙන ඇත. | හිග මුදල් අය කරගැනීමට කටයුතු කළයුතුය. |
| ආ) | සබරගමුව සහ මධ්‍යම පළාත්වල පැකේජ 15 ක් යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතු මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු දින සිට මාස 05 ක් ගතවී ඇතත්, රු. මිලියන 2,969 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකරගෙන නොමැත. | කොන්ත්‍රාත් පරිපාලනය දුර්වල වීම නිසා සිදුවිය හැකි පාඩු | වැඩවල ප්‍රගතියක් නොමැතිකම හේතුවෙන් අයකරගැනීමට බලපායි | හිඟ ශේෂයන් අය කර ගැනීමට ව්‍යාපෘතිය විසින් වහාම පියවර ගත යුතුය. |
| ඇ) | ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් සබරගමුව, මධ්‍යම සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මහජන පැමිණිලි 4,031 න්, පැමිණිලි 707 ක් 2019 මාර්තු 28 දින වන විට ඉක්මන් ක්‍රියාමාර්ග | මහජන විරෝධතා සහ මාර්ග පුනරුත්ථාපන කටයුතු අසාර්ථක වීම. | මහජන පැමිණිලි වලින් බහුතරයක් සම්පූර්ණයෙන්ම විසඳා ඇති අතර ඉතිරිය සම්බන්ධයෙන් 2019 මැයි 31 | ඇල්ම ඇති පාර්ශවයන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් පියවර |

ගැනීමෙන් තොරව නොවිසඳී පවතී. මාර්ග පුනරුත්ථාපන කටයුතු හේතුවෙන් නිවාස අලාභහානි වූ අවස්ථා 145 ක් මෙයට ඇතුළත් ය. කෙසේ වෙතත්, විගණනය සඳහා රක්ෂණ ආශ්‍රිත ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

දින වන විට කටයුතු කරනු ගත යුතුය ලැබේ.

### 3.3 වැඩබිම් පරික්ෂාවේදී සිදු කරනලද නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අ) | කළුතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජය 02 යටතේ පුනරුත්ථාපන කටයුතු වල නිරත වී සිටින කොන්ත්‍රාත්කරු විසින් යොදවා ඇති කාර්ය මණ්ඩලයේ ව්‍යාපෘතියේ කටයුතු සුමට ලෙස ක්‍රියාත්මක වීමට බලපාන ප්‍රධාන තනතුරු වන ව්‍යාපෘති කළමනාකරු, නියෝජ්‍ය ව්‍යාපෘති කළමණාකරු, අධිවේගී මාර්ගය සැලසුම් ඉංජිනේරු, තත්ත්ව සහතික කළමණාකරු, ව්‍යුහාත්මක ඉංජිනේරු, වැඩබිම් ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂක, මිනින්දෝරු, සහකාර මිනින්දෝරුවන් සහ පරිසර හා ආරක්ෂක නිලධාරීන් වසරක කාලයක් පුරප්පාඩු ව පැවතුණි. තවද, 2018 පෙබරවාරි 25 වන දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදීවේදී කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් රසායනාගාර කාර්ය මණ්ඩලයක් යොදවා නොතිබූ අතර කළුතර දිස්ත්‍රික්කයේ පුනරුත්ථාපනය කරන ලද මාර්ගවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට සහායකයින්ට පවරා තිබුණි. | පුද්ගලයින්ගේ හිඟය හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජය යටතේ කොන්ත්‍රාත් පරිපාලන කටයුතු වල සම්පූර්ණ ක්‍රියාවලිය අසාර්ථක වනු ඇත. | කොන්ත්‍රාත් උප වගන්ති 15.1 යටතේ නිවැරදි කිරීම් සඳහා ඉංජිනේරු විසින් දැන්වීම් නිකුත් කර ඇත | ව්‍යාපෘති කළමනාකරණ කමිටුව කොන්ත්‍රාත්කරුට එරෙහිව දැඩි ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යෙදවීමට බලපෑම් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ආ) | කොන්ත්‍රාත්කරු දැනට පවත්නා පෙට්ටි බෝක්කුවේ ඇස්ෆල්ට් ආවරණය කර ඇති අතර බෝක්කුව පුළුල් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද සැලසුමක් නොමැතිව වයඹ පළාතේ වැරැල්ල හන්දියේ සිට නාරම්මල - තම්බරාව පාර දක්වා පළමු කිලෝමීටර් 21 ක කොටසෙහි බෙල් මුඛය පුළුල් කර ඇත. | වාහන ගමන් කිරීමේදී ගැටළු මතු විය හැක. | කොන්ත්‍රාත්කරුගේ පහසුව සැලකිල්ලට ගනිමින් ඉංජිනේරුවරයා පසුව බෝක්කු සහ බෙල් මුඛය පුළුල් කිරීමේ අදහසින් ඇස්ෆල්ට් කොන්ක්‍රීට් දැමීමට ඉඩ දී ඇත. | මේ පිළිබඳව විමර්ශනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ කමිටුව පියවර ගත යුතුය. |
| ඇ) | වයඹ පළාතේ විලාව හන්දියේ සිට කුඹුක්වැව පාර දක්වා 2018 ජුලි 1 වන දින සිදුකරන ලද වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය වී ඇත්තේ ඇස්ෆල්ට් මතුපිට සම්පිණ්ඩනය සම්මත මට්ටම වන සියයට 97 ට වඩා අඩුවෙන්. සියයට 92 සිට 96 දක්වා පරාසයක පැවතුණි. මේ අනුව, තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණය ඒ සඳහා යොදා නොගත් බවට සාක්ෂියකි | මාර්ග වටිනාකමේ ඇති විය හැකි ගැටළු | ග්‍රාමීය මාර්ගවල රථවාහන ඝනත්වය අඩු වීම හේතුවෙන් මේ පිළිබඳ විශේෂඥයින්ගේ උපදෙස් ඇතිව ඇස්ෆාල්ට් හි අවශ්‍ය අවම සම්පිණ්ඩන සංයුතියේ ප්‍රතිශතය අඩු කිරීම සඳහා එය නිකුත් කරන ලදී. | වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියේ ඇති ගැටළු විමර්ශනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ කමිටුව පියවර ගත යුතුය. |

## 3.4 පරිබාහිර ගෙවීම්

---------------------

| විගණන නිරීක්ෂණ<br>-------------------------- | බලපෑම<br>------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>---------------- |
|---|---|---|---|
| ලැබුණු තොරතුරුවලට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට නිකුත් නොකරන ලද ණය මුදල් ප්‍රභවය මත ණය සැපයුම් නියෝජිතායතන විසින් රු. මිලියන 475.94 ක කැප කරු කොමිස් අය කර ගෙන තිබුණි. | වෙන් කිරීම අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගනී. | ණය ගිවිසුම අනුව උපයෝජනය නොකල ශේෂයන් මත කැපකරු කොමිස් ණය බලපැවැත්වෙන දිනෙන් පසු හිමිකම් ලබයි. | අනවශ්‍ය වියදම් අවම කිරීමට පියවර ගත යුතුය. |

## 3.5 පද්ධති සහ පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | පුත්තලම් දිස්ත්‍රික්කයේ PU-02 පැකේජය යටතේ මාර්ග කිලෝමීටර් 74.09 ක් පුනරුත්ථාපනය කිරීමේ ප්‍රමාණ පත්‍ර හා ඉංජිනේරු ඇස්තමේන්තු ආදිය නිසි පරිදි සකස් කර නොමැති අතර ප්‍රමාණ පත්‍ර තුළ ඇතුළත් නොවූ අයිතම යටතේ වැඩ කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. පහත වගුවේ දැක්වෙන පරිදි අත්තනෝමතික ලෙස තීරණය කරන ලද රේටයන්ට අනුව ක්‍රියාත්මක කර තිබුණි. | කොන්ත්‍රාත්තුවේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව | කොන්ත්‍රාත්තුව යටතේ අවශය පරිදි ව්‍යාපෘතියේ අවසාන සැලසුම ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සියලු භූලක්ෂණාත්මක හා අනෙකුත් අවශ්‍ය සමීක්ෂණ සහ සැලසුම් කටයුතු සිදු කිරීම කොන්ත්‍රාත්කරු වගකිව යුතුවේ. එබැවින්, කොන්ත්‍රාත්කරුගේ සැලසුම සහ ඔහුගේ වැඩ කිරීමේ ක්‍රමවේදය මත පදනම්ව සමහර නව අයිතම සහ ගාස්තු අපේක්ෂා කළ හැකිය. | ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ ගැටළු සඳහා වගකිවයුත්තන් හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පියවර ගත යුතුය. |

| පැකේජ අංකය | විස්තරය | ඒකකය | රේටය (රු.) |
|---|---|---|---|
| PU2 | ගස් ඉවත් කිරීම වට ප්‍රමාණය මී.මී. 2000 | සංඛ්‍යාව | 20,000 |
| | කාණු සවි කිරීම කොන්ක්‍රීට් ශ්‍රේණිය 15(20) | ස.මී | 18,000 |
| | කාණු සවි කිරීම කොන්ක්‍රීට් ශ්‍රේණිය 25(20) | ස.මී | 22,000 |

| | | | | |
|---|---|---|---|---|
| | දහර කම්බි ඇතුළත් මි.මී.150 පෙරනිම් කොන්ක්‍රීට් තට්ටු දැමීම   ව.මී   6,000<br><br>දහර කම්බි ඇතුළත් මි.මී.175 සනත්ව පෙරනිම් කොන්කීට් තට්ටු ආවරණ දැමීම   ව.මී   7,200<br><br>කොන්කීට් පයිප්ප ආවරණ දැමීම   ස.මී   20,000<br><br>දහර කම්බි හා සැටලින් ඇතුළත් මි.මී.450 විශ්කම්භ සහිත දහර කොන්ක්‍රීට් බට දැමීම   දික්මීටර්   9,000 | | | |
| (ආ) | 1981 අංක 03 දරණ රාජ්‍ය කොන්ත්‍රාත් පනතට අනුව දේශීය හවුල්කරුගේ සහයෝගයෙන් කොන්ත්‍රාත්තුවක් ලබා ගන්නා විදේශීය කොන්ත්‍රාත්කරු රාජ්‍ය කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් හි ලියාපදිංචි විය යුතුය. කෙසේවෙතත්, දේශීය කොන්ත්‍රාත්කරුගේ සහයෝගය ඇතිව වයඹ පළාතේ සහ කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නියැලී සිටින චීනයේ සහ ඉන්දියාවේ කොන්ත්‍රාත්කරුවන්ගේ සමාගම් 02 ක් ලියාපදිංචි කිරීම පිරික්සා බැලීමට මාර්ග සංවර්ධන අධිකාරිය පියවර ගෙන නොමැත. කෙසේවතත්, කොන්තාත්කරුගේ දුර්වල | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේදී ගැටළු මතු වේ. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන් අය කර ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට අදහස් කෙරේ. | වගකිවයුතු පාර්ශවකරුවන් හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කඩිනම් පියවර ගත යුතු අතර චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමේදී නොසැලකිලිමත්කම සම්බන්ධයෙන් පියවර ගැනීම අවශ්‍යය. |

කාර්ය සාධනය හේතුවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අදාළ කොන්ත්‍රාත්තු පසුව අහෝසි කර ඇති අතර, ඒ සඳහා රු. මිලියන 683.18 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අයකරගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 3.6 පෙර විගණන වාර්තාවල පෙන්වා දෙන ලද නොවිසඳී පවතින කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කටයුතුවල නිරතවී සිටි දේශීය කොන්ත්‍රාත්කරුවෙකු මාර්ග පුනරුත්ථාපන කටයුතු අවසන්වීමෙන් පසු එම යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රතිඅපනයනය කිරීමේ එකඟතාවයෙන් ආනයනය කර තිබූ රු. මිලියන 324 ක් වටිනා යන්ත්‍රෝපකරණ හා උපකරණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 සැප්තැම්බර් 05 දින අංක TIP / TP / 08/53 / 2016-69 දරන චක්‍රලේඛයේ දැක්වෙන නිදහස් බදු සහන යටතේ අයුතු ලෙස ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් පැකේජවල දක්වා ඇති අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා එවැනි යන්ත්‍රෝපකරණ භාවිතය අධීක්ෂණය කිරීම සඳහා වැඩසටහන නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. තවද, එම පැකේජවල සිටින | අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම සහ චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කිරීම | ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සලකමින් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ කොන්ත්‍රාත්කරුවන් සඳහා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මෙම බදු සහනය ලබා දී ඇත. | මේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුවන්ට ඔහුගේ කොන්ත්‍රාත්තු ඉටු කිරීමට නොහැකි වූ අතර එම භාණ්ඩ නැවත අපනයනය කර තිබේද නැද්ද යන්න පරීක්ෂා කිරීමට වැඩසටහන කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | |
| ආ) | කොන්ත්‍රාත් කොන්දේසි උපවගන්ති 4.2 ට අනුව කොන්ත්‍රාත්තුවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා කොන්ත්‍රාත්කරු සිය වියදමින් කාර්යසාධන සුරක්ෂණය ලබාගත යුතු වුවද ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මිළ ගණන් සකස්කිරීමේදී වැරදි අර්ථ නිරූපණයක් ලබාදෙන සිය වියදමින් දරාගත යුතු කාර්යසාධන බැඳුම්කර සැපයීමේ පිරිවැය සඳහා කොන්ත්‍රාත්කරුවන්ට මිළ ගණන් ඉදිරිපත් කිරීමට ඉඩ ලබාදෙමින් ව්‍යාපෘතිය විසින් ඉහත අවශ්‍යතාවයන්ට පටහැනිව ප්‍රමාණපත්‍ර තුල වෙනම අයිතමයක් ඇතුළත් කර තිබූ බවට නිරීක්ෂණය විය. ඒ අනුව රු.මිලියන 608.60 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් සඳහා අයුතු ප්‍රතිලාභ ලබාදීම. | සාමාන්‍ය කොන්දේසි උපවගන්ති 4.2 ට අනුව නැගෙනහිර, උතුර හා බස්නාහිර පළාත්වල පැකේජ ඒ අනුව සංශෝධනය කරන ලද අතර එම අයිතමය ප්‍රමාණ පත්‍ර තුළින් ඉවත් කරන ලදී. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |